බලපිටිය ප්‍රාදේශීය සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

බලපිටිය ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට බලපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඔනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	ප්‍රාදේශීය සභාවට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු පරිගණක 09ක්, මුද්‍රණ යන්ත්‍රයක් ඇතුළු කාර්යාල උපකරණ 12 ක වටිනාකම ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	2025 අවසාන ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	පරිගණක යන්ත්‍ර 09 සහ මුද්‍රණ යන්ත්‍රය ඇතුළු උපකරණ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දී ඉදිරියට ලද වරිපනම් බදු ආදායම රු. 734,104 ක් හිඟහිටි වරිපනම් බදු ගිණුමට හර කර තිබීමෙන් එම වටිනාකමින් වත්කම් වැඩියෙන් සහ වගකීම් අඩුවෙන් දක්වා තිබුණි.	2025 අවසාන ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	හිඟ වරිපනම් ගිණුම සහ ඉදිරියට ලද වරිපනම් ශේෂ නිවැරදි කළ යුතුය.
(ඇ)	සාහිත්‍ය උත්සවය සඳහා වැය කර තිබූ රු.106,810 ක් වර්ෂයේ වියදමට ඇතුළත් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	2025 අවසාන ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	අදාළ වන වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	කර්මාන්ත ණයහිමියන් දෙදෙනකුට රු.මිලියන 2.08 ක් ගෙවා නිරවුල් කර තිබුණද තවදුරටත් එම ශේෂය ණයහිමියන් ලෙස දක්වා තිබුණි.	2025 අවසාන ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම් සිදු කළ යුතුය.
(ඉ)	කර්මාන්ත 02 කට අදාළව රු.මිලියන 2.98 ක් දෙවරක් ගිණුම්ගත කිරීම නිසා ප්‍රාග්ධන ආධාර සහ ණයගැති ගිණුමෙහි ශේෂ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	2025 අවසාන ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම්ගත කිරීම නිවැරදිව සිදු කළ යුතුය.

(ඊ)	රු.මිලියන 5.21 ක වියදම් ප්‍රාග්ධනිත නොකිරීම නිසා ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	2025 අවසාන ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	අඩුවෙන් දක්වන ලද ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම නිවැරදි කළ යුතුය.
(උ)	2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුද්දර ගාස්තු ගිණුමේ බැර ශේෂය රු.322,962 ක් වුවද, 2024 ජනවාරි 01 දිනට එය හර ශේෂයක් ලෙස ඉදිරියට ගෙනවිත් තිබීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට වගකීම එම ප්‍රමාණයෙන් අඩුවෙන් හා ලැබිය යුතු මුද්දර ගාස්තු වත්කම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	2025 අවසාන ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඌ)	2024 දෙසැම්බර් 31 දිනට තොගයෙහි වටිනාකම රු.මිලියන 1.89 ක් වැඩියෙන් දක්වා තිබුණි.	2025 අවසාන ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වැඩියෙන් දක්වන ලද තොග වටිනාකම නිවැරදි කළ යුතුය.
(එ)	වරිපනම් බදු සඳහා ලබාදී තිබුණු රු.මිලියන 1.09 ක වට්ටම හිඟ හිටි වරිපනම් බදු ගිණුමට බැර කර නොතිබීම නිසා හිඟ හිටි වරිපනම් බදු ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	2025 අවසාන ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	හිඟහිටි වරිපනම් බදු වැඩියෙන් දක්වා තිබීම නිවැරදි කළ යුතුය.
(ඒ)	දේශීය ආදායම් කොමසාරිස් වෙත රු.189,646 ක මුද්දර ගාස්තු ප්‍රේෂණය කිරීමේදී විවිධ තැන්පත් ගිණුමට බැර කර තිබීමෙන් තැන්පතු වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	2025 අවසාන ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කිරීම් සිදු කළ යුතුය.
(ඔ)	සමාලෝචිත වර්ෂය තුළ වටිනාකම රු.මිලියන 3.31 ක් වූ ජර්නල් සටහන් 03 කට අදාල පොදු ලෙජරයට පිටපත් නොකිරීමෙන් එම ප්‍රමාණයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වියදම් හා විගණන ගාස්තු වෙනුවෙන් වර්ෂයේ වියදම හා ණය හිමියන් අඩුවෙන් දක්වා තිබුණි.	2025 අවසාන ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	අඩුවෙන් සටහන් වූ ණයහිමි වටිනාකම නිවැරදි කළ යුතුය.
(ඕ)	රු.මිලියන 7.79 ක් වූ ගෙවිය යුතු පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක මුදල් ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	2025 අවසාන ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගෙවිය යුතු පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක මුදල් ශේෂය ගිණුම්ගත කළ යුතුය.

1.6.2 නොසැසඳු පාලන ගිණුම්

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 15 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.මිලියන 297.07 ක වෙනසක් නිරීක්ෂණය විය.	ඉදිරියේ දී නිවැරදි කරන බව.	වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	ස්ථාවර වත්කම්වල වටිනාකම වූ රු.මිලියන 388.35 ක ශේෂය ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ හා ආධාර මගින් දායක වීමේ ගිණුම්වලට සමාන වියයුතු වුවත්, එම ශේෂ අතර රු. මිලියන 157.55 ක වෙනසක් පැවතුණි.	2025 අවසාන ගිණුම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් අතර වූ රු.මිලියන 157.55 ක වෙනසට හේතු පරීක්ෂා කර, ගිණුම් නිවැරදි කළ යුතුය.

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය හා උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. මිලියන 375.52 ක් වූ ගිණුම් විෂයයන් 05 ක ශේෂ සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	උපලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව.	යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන හා උපලේඛන ඉදිරිපත් කළ යුතුය.
(ආ)	එකතු වටිනාකම රු.මිලියන 230.35 කට අදාළ ජර්නල් සටහන් 105 ක් සඳහා ජර්නල් වවුචර් විගණනයට ඉදිරිපත් නොවුණි.	2025 වර්ෂයේ සිට සෑම ජර්නල් සටහනක් සඳහාම ජර්නල් වවුචර් සකස් කිරීමට කටයුතු කරන බව.	අනුමත කරන ලද ජර්නල් වවුචර විගණනයට ඉදිරිපත් කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.මිලියන 0.9 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. මිලියන 12.1 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත අදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්-තුගත ආදායම රු.	බිල් කළ ආදායම රු.	රැස් කළ ආදායම රු.	දෙසැම්බර් 31 දිනට හිඟය රු.	ඇස්තමේන්-තුගත ආදායම රු.	බිල් කළ ආදායම රු.	රැස් කළ ආදායම රු.	දෙසැම්බර් 31 දිනට හිඟය රු.
වරිපනම් හා බදු	23,820,000	21,168,608	17,702,107	37,671,993	22,815,000	22,037,958	19,183,711	34,205,492
කුලී	5,620,000	4,652,202	4,450,343	4,452,592	5,130,000	6,114,336	4,368,920	4,250,733
බලපත්‍ර ගාස්තු	4,015,000	5,104,178	5,104,178	-	2,810,000	4,063,042	4,077,992	-
	33,455,000	30,924,988	27,256,628	42,124,585	30,755,000	32,215,336	27,630,623	38,456,225

2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	වරිපනම් බදු		
(i)	සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.මිලියන 34.20 ක් වූ හිඟ වරිපනම් බදු ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.මිලියන 37.67 දක්වා රු.මිලියන 3.47 කින් වර්ධනය වී තිබුණි.	ඉදිරියේ දී එම හිඟය අවම කර ගැනීමට ක්‍රියා කරන බව.	හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	වරිපනම් බදු අය කළයුතු 19,516 ක් වූ මුළු දේපල සංඛ්‍යාවෙන් දේපල 10,645 කින් සමාලෝචිත වර්ෂයට අදාළව රු.මිලියන 7.97 ක වරිපනම් බදු මුදලක් අයකර ගෙන නොතිබූ අතර, ඊට අදාළ පෙර වර්ෂවල හිඟය රු.මිලියන 18.98 ක් විය.	ඉදිරියේදී මෙම හිඟය අවම කර ගැනීමට ක්‍රියා කරන බව.	ප්‍රවර්තන වරිපනම් හා හිඟ වරිපනම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	කුලී		
(i)	සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා රැස් කළයුතු සමස්ථ කුලී ආදායම රු.මිලියන 8.90 ක් වුවද, වර්ෂය තුළ රැස් කළ ආදායම රු.මිලියන 4.45 ක් වීමෙන් ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය සියයට 50 ක් වූ අතර, වර්ෂ අවසානයට රු.මිලියන 4.45 ක හිඟ ශේෂයක් විය.	හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව හා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

(ii)	අහුන්ගල්ල පොදු වෙළඳපල සංකීර්ණයේ කඩ කාමර 15 ක ගිවිසුම් 2023 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වී තිබුණද, දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 05 ඡේදය අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි.	කඩ කාමර 2 ක් මුද්‍රා තබා ඇති බවත්, කඩ කාමර 2 ක් නැවත සභාවට භාරදී එක්වන් මුදලින් හිඟ මුදල් පියවා ගන්නා ලෙස දැනුම් දී ඇති බවත් හා කඩ කාමර 8 ක ගිවිසුම් යාවත්කාලින කර ඇති බව.	ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන හා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	වෙනත් ආදායම් පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතුව තිබූ මුද්දර ගාස්තු රු.මිලියන 40.67 ක් විය.	හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් අයකර ගැනීමට ප්‍රධාන ලේකම් කාර්යාලය හා ඉඩම් රේජිස්ටාර් දෙපාර්තමේන්තුව එක්ව විධිමත් වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිදෙර්ශය**
අහුන්ගල්ල දෙමහල් පොදු වෙළඳපොල ගොඩනැගිල්ලේ මාළු වෙළඳාම් කිරීමට ඉදිකර තිබුණු කඩ කාමර තුන 2018 වර්ෂයේ සිට ආදායම් උපයා ගැනීමේ කාර්යයට යොදා ගැනීමෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.	මෙම මාළු වෙළඳසැල්වල ව්‍යුහය වෙනස්කර සංවර්ධනය කර මෙම වෙළඳසැල් සාමාන්‍ය වෙළඳාම සඳහා බදුදීමට කටයුතු සිදුකරමින් පවතින බව.	ගොඩනැගිල්ල ඵලදායීව යොදා ගත යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදේශය
සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 04 වන දින තෙක් ගබඩා භාරකරු විසින් නිකුත් කරන ලද රු.907,040 ක් වටිනා ඒකක 307 ක විදුලි තොගයක් විදුලි කාර්මික විසින් සවි කර නොතිබුණි.	අයිතම විදුලි රාජකාරී සටහන්වල සඳහන් කර ඇති බව.	වීදි පහන් සවිකිරීම් පිළිබඳ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදේශය
(අ)	සභාවේ කඩ කාමර බදු දීමට අදාළ ගිවිසුම් පත්‍රයේ 18 වන කොන්දේසිය අනුව පවරා දෙනු ලබන දේපලවලට සහ පරිශ්‍රයට සිදුවන කවර හෝ හානියක් සම්බන්ධයෙන් බදු ගැණුම්කරු වගකිව යුතු වුවත්, ඒ පිළිබඳ අවධානය යොමු නොකර බහුකාර්ය ගොඩනැගිල්ලේ අංක 07 කඩ කාමරයේ වීදුරු ආවරණයකට 2023 වර්ෂයේදී අවස්ථා දෙකකදී සිදු වූ හානි හේතුවෙන්, නැවත අළුත්වැඩියා කටයුතු සඳහා සභා අරමුදලින් රු.147,463 ක් වැය කර තිබුණි.	ඉදිරියේදී කඩ කාමර සඳහා ගිවිසුම්ගත වීමේදී " බදු ගැණුම්කරු විසින් පිළිගත් රක්ෂණ ආවරණයක් ලබාගත යුතුය " කොන්දේසියක් ඇතුලත් කිරීමට පියවර ගෙන ඇති බව, හා සිදු වී ඇති හානිය පිළිබඳව සොයා බලා අවශ්‍ය පියවර ගැනීමට නියමිත බව.	බදු දීමෙන් පසු සිදුවන හානි බදු ගැණුම්කරුගෙන් අයකර ගත යුතුය.
(ආ)	කොස්ගොඩ උප කාර්යාල ගොඩනැගිල්ලේ ඉහල මහල වසර පහක පමණ කාලයක සිට නිශ්කාර්යව පවතින අතර, මෙම ගොඩනැගිල්ලේ වහල අළුත්වැඩියා කර, ඵලදායී කාර්යයකට යොදාගෙන නොතිබුණි.	ඉදිරියේදී වහල අලුත්වැඩියා කර ඵලදායී කාර්යයකට යොදා ගැනීමට යෝජිත බව.	වත්කම් ඵලදායීව යොදාගත යුතුය.

3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදේශය
(අ)	හීනටිය පොදු ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සඳහා 2022 වර්ෂයේ රු.600,000 ක් හා ආදාදොල ටෙනිසන් සිල්වා ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 1.6 ක වියදමක් දරා තිබුණ ද, මෙම ක්‍රීඩාංගන දෙකම භාවිතා කිරීමට හැකි පරිදි මට්ටම් කර නොතිබුණි.	ලැබෙන ප්‍රතිපාදන මත ඉදිරියේදී අදියර වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම සංවර්ධනය කිරීමට යෝජිත බව.	අරමුදල් ඵලදායීව උපයෝජනය කළ යුතුය.
(ආ)	2019 වර්ෂයේදී සභාවට පවරා දී තිබුණු බහු කාර්යය ගොඩනැගිල්ලේ බිම් මහල ආදායම් ඉපයීම සඳහා භාවිතා කර තිබුණද දෙවන මහල ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැති බැවින් එහි ස්ලැබ් (Slab) තට්ටුව පරිසරයට නිරාවරණය වෙමින් දිරාපත්වීමේ හා පළමු මහලට වතුර කාන්දුවීමේ අවදානමක් පැවතුණු අතර එහි ඉදිකිරීම් අවසන් කොට ආදායම් ඉපයීමේ කාර්යයට යොදා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.	වහලෙහි වැඩ අවසන් කිරීමට සහා අරමුදල් ප්‍රමාණවත් නොවන හෙයින් දේශීය ණය අරමුදලින් ණය මුදලකින් හෝ වෙනත් ප්‍රතිපාදනයක් මත ගොඩනැගිල්ලේ සංවර්ධන කටයුතු සිදුකර ආදායම් ඉපයීමේ කාර්යයට යොදා ගැනීමට කටයුතු සිදුකරන බව.	ගොඩනැගිල්ල ඵලදායීව භාවිතා කළ හැකි පරිදි ඉදි කිරීම් නිම කිරීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	තොටවත්ත රාජපක්ෂ මාවත සංවර්ධනය කිරීම සඳහා ඉකුත් වර්ෂයේදී සභා අරමුදල් ප්‍රතිපාදන මත රු.මිලියන 1.8 කට ගිවිසුම් ගත වී රු. මිලියන 1.77 ක් ගෙවා තිබුණි. මෙම කර්මාන්තය සඳහා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වාදී තිබුණු 2023 වර්ෂයේ දෙවන භාගයේ මිල අනුපාත භාවිතා නොකර 2023 මැයි මාසයේ මිල අනුපාත භාවිතා කිරීම නිසා සභා අරමුදලට රු.177,938 ක පාඩුවක් සිදු වී තිබුණි.	මෙම කර්මාන්තය සඳහා ඇස්තමේන්තු 2023 වර්ෂයේ ඔක්තෝබර් 07 දින සකස් කර ඇති බවත්, එය 2023 ඔක්තෝම්බර් 10 දින කර්මාන්ත කමිටුව මගින් අනුමත කර ඇති බවත්, මිල ගණන් පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ලැබී ඇත්තේ 2023.10.24 දින බව.	සභා අරමුදලට වාසිදායක ලෙස ඇස්තමේන්තු සකස් කළ යුතු අතර සිදු වී ඇති පාඩුව අයකර ගත යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදේශය
(අ)	මානව සම්පත් සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සභාවේ නිලධාරීන් 13 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.	මෙම තනතුරු අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2014 අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	සභාවේ කාර්යභාර්ය හා විෂය පථය අනුව කාර්යමණ්ඩල සමාලෝචනයක් සිදුකර සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව වසර 05 කට වඩා සේවයේ නියුතු නිලධාරීන් හට වාර්ෂික ස්ථාන මාරු ලබා දියයුතු වුවද, එයට අනුකූල නොවන පරිදි බලපිටිය ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නිලධාරීන් 15 දෙනෙකු වසර 06 ත් වසර 25 ත් අතර කාලයක් එහි සේවයේ යොදවා තිබුණි.	ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරිමේ දී එම තනතුරුවලට අදාළව ස්ථාන මාරුවීම් ලබා දෙන්නේ නම් කාර්යාලයේ රඳවා තබා නොගෙන ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව.	චක්‍රලේඛ විධිවිධාන අනුව ස්ථාන මාරු වීම් සඳහා කටයුතු කළ යුතුය.